SLGURU.LK

සියළුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

ශාන්ත පීතර විදුහල - කොළඹ 04
புனித பேதுரு கல்லூரி, கொழும்பு 4
St. Peter's College - Colombo 04

11	S	I,II

07 ශ්‍රේණිය – දෙවන වාර ඇගයීම - 2023
Grade 07 – Second Term Examination - 2023

බුද්ධ ධර්මය
Buddhism

පැය Hour 02

නම: ..... පන්තිය: ..... අංකය: .....

i වන කොටස

01. නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. බෝසතාණන් වහන්සේ ලෝකයාට කළගුණ සැලකීමේ අගය හෙලිකළේ _____ ය.

a). පළමු සතියේ දී
b). දෙවන සතියේ දී
c). තෙවන සතියේ දී
d). සිව්වන සතියේ දී

2. කෝලිත උපතිස්ස පිරිවැජියන් දෙදෙනාගේ මුල්ම ගුරුවරයා වූයේ _____ ය.

a). අසිත තාපසතුමා
b). සංජය පිරිවැජියා
c). අක්කෝස බමුණුතුමා
d). උපක ආජීවක

3. ආදර්ශවත් නායකත්වයක් පෙන්නුම් කරන ජාතක කතාව වූයේ _____ ය.

a). සඳ කිඳුරු ජාතකය
b). බක ජාතිකය
c). අපණ්ණක ජාතකය
d). ස්වර්ණ හංස ජාතකය

4. වැරදි පුරුදු නිසා හට ගන්නා ආබාධ _____ යනුවෙන් හඳුන්වයි.

a). විසමපරිහාරාජා ආබාධ
b). වාන සමුට්ඨානා ආබාධ
c). ඔපක්කමිකා ආබාධ
d). පිත්ත සමුට්ඨානා ආබාධ

5. බුද්ධ ශාසනයේ සිදු වූ පළමු ආරාම පූජාව වූයේ _____ යි.

a). වේලුවනාරාමය
b). පූර්වාරාමය
c). ජේතවනාරාමය
d). නීග්‍රෝධාරාමය

6. බුදුන් වහන්සේ දෙව් මිනිසුන්ගේ ශාස්තෘවරයා වූ බැවින් _____ නම් වන සේක.

a). භගවා
b). බුද්ධ
c). සම්මා සම්බුද්ධ
d). සත්ථා දේව මනුස්සානං

7. උපතක් සොයන සතත්වයෝ _____ නම් වේ.

a). සම්භවේසී b). දිට්ඨා c). රස්ස d). අණුක

SLGURU.LK

For Educational Purpose Only

SLGURU.LK

8. ජීවිතයක කුසලාකුසල කර්ම අනුව සිදුවන වෙනස්කම් _____ ඇතුළත් වේ.

a). චිත්ත නියාමයට
b). විරතිය
c). ධම්ම නියාමයට
d). කම්ම නියාම

9. පුණ්ණ හිමියන්ගේ චරිතය තුළ පැවති උතුම්ම ගුණය වූයේ _____ ය.

a). කාරුණික බව
b). මෛත්‍රිය
c). නිහතමානී බව
d). ඉවසීම

10. "සිව් පස් සිය නැණින්" යන කවියෙහි අවසන් කවි පදය වනුයේ,

a). දුරලයි අනුවණින්
b). දැන දැන්වීය කුළුණින්
c). බෙදුයෙන් දහමන්
d). එබදු නම් වීය ගුණ පමණින්

(2×10=20)

02. කෙටි පිළිතුරු සපයන්න.

1. බුදු ගුණ 03 ක් නම් කරන්න.
2. ත්‍රි විද්‍යා නම් කරන්න.
3. නියාම ධර්ම 03 ක් නම් කරන්න.
4. ශිෂ්ඨ සම්පන්න පුද්ගලයෙකු තුළ තිබිය යුතු ගුණාංග 03 ක් ලියන්න.
5. අග්‍රශෂ්‍ය දානය යනු කුමක් ද?
6. භාරතීය සමාජය තුළ විද්‍යමාන වූ කුල ක්‍රම 03 ක් නම් කරන්න.
7. ත්‍රි ශික්ෂා නම් කරන්න.
8. ත්‍රි ලක්ෂණ නම් කරන්න.
9. භාවනා කිරීම තුළින් අප හට ලැබෙන ප්‍රයෝජන 03 ක් නම් කරන්න.
10. ඔබ දන්නා මංගල සූත්‍රයෙහි අඩංගු මංගල කාරණා 03 ක් ලියන්න.

(3×10=30)

03. සියලු ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1. a). සිඟාලෝවාද සූත්‍රයට අනුව ගුරුවරයාගෙන් දරුවන්ට විය යුතුකම් 05 ක් නම් කරන්න. **(ලු. 05)**

   b). සිඟාලෝවාද සූත්‍රයට අනුව දරුවන්ගෙන් ගුරුවරයා හට වියයුතු යුතුකම් 05 ක් නම් කරන්න. **(ලු. 05)**

2. a). "ඉවසීම" යන්නෙන් අදහස් කෙරෙන්නේ කුමක්දැයි පැහැදිලි කරන්න. **(ලු. 02)**

   b). අප හට ඉවසීම නොතිබීම නිසා ඇතිවන දුර්විපාක 03 ක් නම් කරන්න. **(ලු. 03)**

   c). ඉවසීමෙන් ලැබෙන ආනිශංස ධර්ම 05 ක් ගැන බුදුන් වහන්සේ දේශනා කොට ඇත. ඒවා නම් කරන්න. **(ලු. 05)**

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

3. a). i. "පින්මද පුතුන් සියයක් ලදුවත් නිසරු" යන කවිය සම්පූර්ණ කරන්න. **(ලු. 03)**

ii. සහජීවනය යන්න අර්ථ දක්වන්න. **(ලු. 02)**

iii. සහජීවනයෙන් කටයුතු කිරීම තුළින් ලබාගත හැකි ප්‍රයෝජන 05 ක් නම් කරන්න. **(ලු. 05)**

ii වන කොටස

01. පළමු ප්‍රශ්නය ඇතුළත්ව ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න.

07 ශ්‍රේණියේ "සියල්ල කර්මයෙන් සිදුනොවේ" පාඩම ඇසුරින් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

i. යම් ගැටලුවක් පිළිබඳ එක් පැත්තකින් පමණක් බැලීම _____ නම් වේ. **(02)**

ii. යම් ගැටලුවක් පිළිබඳ නොයෙක් පැති වලින් බලා කටයුතු කිරීම _____ වේ. **(02)**

iii. අටලෝ දහම නම් කරන්න. **(08)**

iv. උතු නියාමයට නිදසුන් 03 ක් සපයන්න. **(03)**

v. නියාම ධර්ම 05 ලියා දක්වන්න. **(05)**

(මුළු ලකුණු 20)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

“Education is the passport to the future, for tomorrow belongs to those who prepare for it today.” — Malcolm X



Visit SLGURU.LK to download papers and notes.

SLGURU.LK
For Educational Purpose Only